
# බෞද්ධාලෝකය

ඊ පුවත්පත

සමස්ත ලංකා බෞද්ධ  මහා සම්මේලනය

ශ්‍රී බුද්ධ වර්ෂ 2565
වෙසක් මස 15 ඉරිදා



# බෞද්ධාලෝකය

## බොදු පිළිවෙත තුළින් සමාජ සුභසාධනය

විල් දිය දහසකදී සුවහසක් මල් නෙළුම් පිපුණ ද එකී මල් සුවඳ ගම් දනව් සිසාරා පැතිරුණ ද සුන්දර ගෙත්තමක් සේ විචිත්‍රවත් රටා මැව්ව ද ලොව එතෙක මෙතෙක් බිහි වූ පද්මෝදාරය වන සම්මා සම්බුදුරජාණන් වහන්සේ දේශනා කළ බොදු පිළිවෙත හා සමාජ සුභසාධනය වත්මන් වල්මත් සමාජයට අන් කවරදාටත් වඩා යෝග්‍ය වේ.

හංසයා දියෙන් කිරි බිදු වෙන් කරන්නා සේ අධර්මය රජයන සමාජය තුළ ධර්මය වෙන් කර ගෙන කටයුතු කිරීම දුෂ්කර කාර්යයක් වුවද අප ක්‍රියාත්මක විය යුත්තේ ද ධාර්මික ප්‍රතිපදාවෙම වෙයි.

ලැජ්ජා-භය ලෝක පාලක ධර්මයන් වේ. ලොව සදාචාරය ඇතිවන්නා සේ පාලනය වන්නේ පවට ඇති ලැජ්ජා-භය නිසා වෙනි. එය සමාජයක් වඩාත් සදාචාර සම්පන්න වීමට හේතුවෙයි. පවින් ඈත්වීම පමණක් ප්‍රමානවත් නොවන්නේ අප ලෞකික ජීවිතය සාර්ථක කර ගැනීමටය.

බුදුරජාණන් වහන්සෙගේ දේශනාවට අනුව ව්‍යස්ඝපජ්ජ සූත්‍රය මිනිසා ගේ මෙලොව හිත සුව පිණිස කාරනා සතරක් දේශනා කොට ඇත. උට්ඨාන සම්පදා, ආරක්ඛ සම්පදා, කළ්‍යාණ මිත්තතා,සමජීවිකතා යනුවෙනි.

අප හැමවිටම කෙසේ කටයුතු කරන්නේ ද යන්න තුළින් අප කෙතරම් දුරට බෞද්ධ යන්න වටහා ගත හැකි වේ. නූතන සමාජ ආර්ථික හා දේශපාලන අර්බුදය හමුවේ ද ඇත්තේ පාලක පාලිත දෙපක්ෂයම සතර සම්‍යක් ප්‍රධාන වීර්යයෙන් කටයුතු කිරීමටය

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය මඟින් මාසිකව සෑම පුර පසළොස්වක පොහෝ දිනකම පලකරනු ලබන බෞද්ධාලෝකය ඊ-පුවත්පත සඳහා නිර්මාණ ඉදිරිපත් කිරීමේ අවස්ථාව ඇත.නිර්මාණ ඉදිරිපත් කිරීමට කැමැත්තේ නම්, එම නිර්මාණ පහත සඳහන් ලිපිනයට ලියා එවීම හෝ විද්‍යුත් ලිපිනය ඔස්සේ එවීමට කටයුතු කළ හැක (පිටු දෙකක ප්‍රමාණයට සෑහෙන තරම්) සෑම කලාපයක්ම www.acbc.lk අප වෙබ් අඩවියෙන් නිකුත් කරන අතර මීට පෙර නිකුත් කරන ලද මාසික ඊ-පුවත්පත් අප වෙබ් අඩවියෙන් පරිශීලනය කළ හැක


**බෞද්ධාලෝකය**

**උපදේශක මණ්ඩලය**
මහාචාර්ය නිමල් ද සිල්වා
මහාචාර්ය මාලිනී ඇඳගම
මහාචාර්ය සුසිරිපාල මාලිම්බඩ

**සංස්කරන කළමණාකරනය**
ඉෂාන් බුද්ධික එදිරිසූරිය

**සංස්කාරක මණ්ඩලය**
නාලක ජයසේන
ශ්‍යාම් නුවන් ගනේවත්ත

**පිටු සැකැස්ම**
කාවින්ද දිල්ෂාන්
ක්‍රිෂාන්ති දිසානායක

**ප්‍රකාශනය**
බෞද්ධ තොරතුරු මධ්‍යස්ථානය
සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය



**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය**
අංක 380. බෞද්ධාලෝක මාවත. කොළඹ 7.
දුරකථනය ( 011 2691659 / 011 2688517 / 011 2667017)
ෆැක්ස් (011 2688517 )
web : www.acbc.lk
E-mail : acbc380@gmail.com




# බුදුරජාණන් වහන්සේ වෙසක් පුන් පොහෝ දිනයක් ද ඇතුළුව තෙවරක්ම ලක් දිවට වැඩම කිරීමේ වැදගත්කම



සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පෙරුම් පුරා තමන්වහන්සේ විසින් අවබෝධකොට ගත් චතුරාර්ය සත්‍යය සහ ආර්ය අෂ්ඨාංගික මාර්ගය පදනම් කොට ගත් දහම සුරක්ෂිත කර ගැනීම සඳහා දඹදිව පුරා මෙන්ම ඉන් පිටස්තර ප්‍රදේශ වලද එය ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාව බුදුන්වහන්සේ විසින් අවබෝධකොට ගෙන තිබූ බව උන්වහන්සේගේ ජීවන රටාවෙන් පැහැදිළිය. ඒ අනුව ස්වකීය නිජබිම වූ දඹදිව විවිධ ප්‍රදේශවල පමණක් නොව ඉන් බාහිර රටවලද එය ව්‍යාප්ත කිරීමේදී තම ධර්මය දීර්ඝ කාලීනව සුරක්ෂිත කර ගැනීම සඳහා ඉතාම යෝග්‍ය දේශය ලක්දිව බව උන්වහන්සේ විසින් හඳුනාගෙන තිබූ බවද පැහැදිලිය.

බුදුරජාණන්වහන්සේ බුද්ධත්වයට පත්වීමෙන් පසුව භික්ෂුන්වහන්සේ 60 නමකින් යුක්ත පළමුවෙනි ධර්මදූත පිරිස ද භික්ෂුන්වහන්සේ 30 නමකින් යුක්ත දෙවෙනි ධර්මදූත පිරිස ද සූදානම් කොට භික්ෂුන් වහන්සේ දෙනමක් හෝ එක් මග නොගොස් විවිධ දිශාවන්ට වඩින ලෙස නියම කොට පිටත් කර යැවූසේක. අනතුරුව දුරුතු මස පුර පසළොස්වක් පොහොය දිනයේ තමන් වහන්සේගේ පිහිටක් අවශ්‍ය තැනක් ලොව කොතැනක හෝ තිබේ දැයි සුපුරුදු පරිදි දිවැසින් බැලූහ. එවිට ලංකාවාසී එක්තරා ජන කොටසකට සමගි සම්පන්නව ජීවත්වීමට තමන් වහන්සේගේ පිහිටක් අවශ්‍ය බව දැක අහසින් වැඩම කොට වර්තමානයේ මහියංගන චෛත්‍යය ඉදිකොට ඇති ස්ථානයට සැපත් වී එහි සම්කඩක් අතුරා වැඩ සිටි සේක. එතැන් සිට අවට පරීක්ෂාකිරීමේදී උන්වහන්සේට මහවැලි ගඟ අසබඩ මහානාග වනයෙහි කඳවුරු බැඳගෙන නාග ගෝත්‍රික ජනතාව (එකල ලක්දිව යක්ෂ,නාග, දේව, රාක්ෂ යන සිව් හෙළයන් ජීවත්වූ බව සාමාන්‍ය පිළිගැනීම වේ) දෙපිලකට බෙදී සටනට සූදානම්වනු දක්නට ලැබිණි. උන්වහන්සේගේ සෘධි ප්‍රාතිහාර්යයන් බලයෙන් ඔවුන් මෙල්ලකොට අනතුරුව ධර්මය දේශනාකොට විසිරුවා හැර දෙපාර්ශවය සමාදාන කළ සේක. රැස්ව සිටි දේව සමූහයාටද තෙරුවන් සරණයාමට සලස්වා ධර්මය දේශනා කළ සේක. එම අවස්ථාවේ මෙරට ජනතාවට වන්දනා මාන කිරිම සඳහා බුදුරජාණන්වහන්සේගෙන් පූජනීය යමක් ඉල්ලා සිටි සුමන සමන් දේව රාජයාට තම හිස පිරිමැද කේශධාතු මිටක් ලබාදුන් බවද එදිනම ආපසු උරුවෙල් දනව්වට වැඩම කළ බවද බෞද්ධ ශාසන ඉතිහාසයේ දක්වා ඇත. සුමන සමන් දේව රාජයාද තමාට ලැබුන කේශ ධාතු නිදන්කොට බුදුරජාණන්වහන්සේ වැඩ සිටි ස්ථානයෙහි මහියංගන චෛත්‍ය ඉදිකළ බවද ඉතිහාසයේ සටහන් වී ඇත.

බුදුරජාණන්වහන්සේගේ ප්‍රථම ලංකා ගමන මෙන්ම දෙවෙනි ලංකා ගමනද මෙරට පාලකයින් අතර ඇතිවූ අසමගියක් සමාදාන කිරීම සඳහා වූවකි. ඒ අනුව වර්තමාන ශ්‍රී ලංකාවේ පාලකයින් අතර පවතින අතීශය විනාශකාරී භේද භින්නතා සියවස් 28ක

පමණ සිට- එනම් මෙරට පූර්ව ඓතිහාසික අවධියේ සිටම- අපට උරුම වී ඇති අතිශය ශෝචනීය තත්ත්වයක් කියාපාන සාධකයක් ලෙස සැලකීමට පුළුවන.

සැවැත්නුවර වැඩ සිටි බුදු රාජණන්වහන්සේ බක් මස අව පසලොස්වක පොහොය දින අළුයම සුපුරුදු පරිදි දිවැසින් ලොව බලද්දී ලක්දිව චූලෝදර සහ මහෝදර නමැති සහෝදර රජුන් දෙදෙනා අතර මැණික් පුටුවක් සඳහා වූ මතභේදය මත යුද්ධයක් ඇතිවීමට පරිසරය සැකසී ඇති බව දුටුසේක. උන්වහන්සේ වහාම එම දෙසොහොයුරන් කෙරෙහි කරුණාවෙන්, සෘධි බලයෙන් ලක්දිවට වැඩම කිරීමට තීරණය කළහ. ඒ වනවිටත් සටනට සූදානම් ව සිටි දෙසොහොයුරන් සහ සේනාවට පෙනෙන ලෙස අහසෙහි පෙළහැර පෑ බුදුරජාණන්වහන්සේ නාගදීපයට වැඩම කොට ධර්ම දේශනා කළ සේක. විවිධ ජාතක කථා සහ ධර්ම පාඨ ගෙනහැර දක්වමින් වෛර බැඳීමේ දෝෂයද සමගිව සිටීමේ අනුහස් ද පැහැදිළිකොට අවවාද කළ සේක.

වර්තමානයේ බුදුරජාණන්වහන්සේ ජීවමානව වැඩ සිටියේ නම් පාලකයින් අතර පවතින දේශපාලන පක්ෂ භේද පමණක් නොව සමස්ථ ජනතාවම බෙදී සිටින ජාති, කුල, ආගම්, පක්ෂ, පාට ආදී විවධ භේදතා නිශ්ඵල දෑ බව වටහා දෙනු නොඅනුමානය. උන්වහන්සේගේ ධර්මය සකල ලෝකවාසී සත්වයාට අවබෝධකරදීම සඳහා පුරුදු පුහුණු කොට සම්බුද්ධ ශාසනයට උරුමකොට දුන් භික්ෂුන්වහන්සේලාට ද අප රට තුල එම කාර්ය භාරය හරියාකාරව ඉටුකරගත නොහැකි වී ඇත. එබැවින් ‘අපි බෙදී මැරෙමුද? නැතහොත් සමගිවී රැකෙමුද’? යන ගැටළුව අමතක කොට අඛණ්ඩව භේද භින්නව සිටීම වර්තමානයේ ලොව ප්‍රධානතම බෞද්ධ රටක් ලෙස ප්‍රචලිත ශ්‍රී ලාංකේය ජාතියේම අභාග්‍යයකි.

බුදුරජාණන්වහන්සේගේ නාගදීපයට වැඩමකොට සිදුකළ ධර්ම දේශනයෙන් පැහැදුන දෙපක්ෂයේ නාරජවරු ඔවුන් අතර අරගල කරගත් මැණික් පුටුව උන්වහන්සේට පූජා කළහ. භාග්‍යවතුන් වහන්සේද ඒ මත වාඩි වී එය පිළිගත් බව සනාථ කළහ. අනතුරුව බුදුන්වහන්සේට ප්‍රනීත දානයක් පූජා කළ අතර තම දෙසොහොයුරන් අතර වූ යුද්ධය වෙනුවෙන් නාගදීපයට පැමිණ සිටි කැළණිය ප්‍රදේශයේ පාලක මණිඅක්ඛික නාරජු බුදුන්වහන්සේ කෙරෙහි පැහැදී පූජණිය වස්තුවක් ලබාදෙන ලෙස ඉල්ලා සිටියේය. එසේම මතු දිනක කැළණියට වැඩම කරන ලෙසද ආරාදනා කළේය. නා රජවරුන් විසින් බුදුරජාණන්වහන්සේට පූජා කරන ලද මැණික් පුටුව පූජනීය වස්තුවක් ලෙස ඔවුන්ට ආපසු භාරදුන් උන්වහන්සේ ආපසු ජේතවනාරාමයට වැඩි සේක.

බුදුරජාණන්වහන්සේ ගේ තුන්වෙනි ලංකා ගමන මණිඅක්ඛික නා රජුගේ ආරාධනාවේ ප්‍රතිඵලයකි. බුද්ධත්වයෙන් 8 වෙනි වර්ෂයෙහි වෙසක් මස පුර පසලොස්වක දින මනිඅක්ඛික නා රජුගේ ආරාධනාව පරිදි බුදුරජාණන්වහන්සේ භික්ෂුන් වහන්සේ 500ක් පමණ වූ පිරිසක්ද කැටුව හිමිදිරි උදෑසන කැළණියට වැඩම කළ සේක. බෞද්ධාගමික සිරිත් විරිත් අනුව ආසන පනවා උත්සවාශ්‍රීයෙන් දූත පිරිස පිළිගත් රජු ප්‍රධාන කොට රැස්ව සිටි පිරිස උන්වහන්සේලාට උදේ දානය පූජා කළහ.

අනතුරුව බුදුරජාණන්වහන්සේ රැස්ව සිටි පිරිසට ධර්ම දේශනා කරමින් සසර වසන සියලු සත්වයින්ට ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ දෝමනස්ස යන සියලු දේ උරුම බවද ජීවිතය නිස්සාර බවද ධන සම්පත් අස්ථිර බවද නන්වැදෑරුම් ශෝක තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවන බවද පැහැදිළි කළ සේක.

එහෙයින් ස්වභාවයෙන්ම රූප, ශබ්ද, රස, ගන්ධ, ස්පර්ෂ ආදි වූ පංචකාමයෙහි ඇලෙන බවද එමගින් තව තවත් දුකට පත්වන බවද පැහැදිළි කරමින් ධර්‍ම දේශනා කළහ. මනුෂ්‍ය, දේව, සහ බ්‍රහ්ම යන සියලු ආත්මවල විවිධ සම්පත් ඇති බව සත්‍ය වුවත් ඒ සියල්ලට වඩා 'නිවන් සුවය' ශ්‍රෙෂ්ඨ බවද ඒ නිසා බුද්ධෝත්පාද කාලයක ඉපදී සිටින මනුෂ්‍යයින් නොපමාව දාන, ශීල, භාවනාදී පිංකම්වල නිරත වෙමින් නිවන් මග අවබෝධකර ගත යුතුව ඇති බවද පැහැදිළි කළ සේක.

අනතුරුව කැළණි ගඟෙන් ජලස්නානය කොට භික්ෂූන් වහන්සේලා ද සමග දහවල් දානය වැළඳූ බුදුරජාණන්වහන්සේට තමන් වසන සමන්තකූට පර්වතයට වැඩම කරන ලෙස සුමන සමන් දේව රාජයා විසින් ආරාධනා කරන ලදී. එකී ආරාධනාව පිළිගත් බුදුරජාණන්වහන්සේ තම ශ්‍රාවක පිරිස ද කැටුව එම වෙසක් පුන් පොහෝ දිනයේදීම පස්වරුවේ අහසින් එම පර්වතය කරා වැඩියහ. එහිදී උන්වහන්සේගේ ශ්‍රීපාද ලකුණ සනිටුහන් කරන ලෙස සුමන දේව රාජයා විසින් කරන ලද ඉල්ලීමට එකඟවූ බුදුරජාණන්වහන්සේ සමන්තකූට පර්වතය මුදුනෙහි තම සිරපා සටහන පිහිටුවූ සේක.

ඉන්පසු උන්වහන්සේ පර්වත ප්‍රාන්තයෙහි එක් ගල් ලෙනක දිවා විහරණය කළ අතර වර්තමානයේ එය භගවද් ගුහාව (භගවා ලෙන) ලෙස හඳුන්වනු ලැබේ. ශ්‍රාවක භික්ෂූන්වහන්සේලා ද පර්වතයෙහි තැනින් තැන වූ ගල්ලෙන්වල දිවා විහරණය කළහ. බුදුරජාණන්වහන්සේ එතැනින් නික්ම රුහුණු ජනපදයට වැඩම කොට අනාගතයේදී එහි දීඝවාපී ස්තූපය ඉදිකෙරෙන තැන සනිටුහන් කරමින් නිරෝධ සමාපත්තියට වැද ටික වේලාවක් ගත කළ බවද සඳහන්වේ.

ලංකාවට වැඩම කළ මෙම තුන්වෙනි ගමනේදී බුදුරජාණන්වහන්සේ ඊළඟට අනුරාධපුර භූමි භාගයට වැඩම කොට ශ්‍රී මහා බෝධීන් වහන්සේ රෝපණය කිරීම ප්‍රධාන කොට ගත් දැනට ඉදිකර ඇති ථූපාරාමය, රුවන්වැලිසෑය, ආදී වූ බොහෝ වෙහෙර විහාර අනාගතයේ ඉදිකිරීමට නියමිත ස්ථානවල ස්වල්ප වේලාව බැගින් නිරෝධ සමාපත්තියෙන් වැඩ හිඳ අනතුරුව රැස්ව සිටි ජනතාවට ධර්මය දේශනාකොට දඹදිව සැවැත්නුවර ජේතවනාරාමයට වැඩම කළසේක.

එපරිද්දෙන් බුදුරජාණන්වහන්සේ ගිහියකු ලෙස සිදුහත් කුමරු නමින් උපත ලැබීම, උන්වහන්සේ බුදුවීම සහ පිරිනිවන් පෑම යන තෙමගුල සිදුවූ වෙසක් පුන් පොහෝදිනය ශ්‍රී ලාංකේය බෞද්ධ ජනතාවට අති විශේෂ වූ අග්‍රතම පූජනීය දිනයක් බවට පත්කරමින් සමනොල කඳු මුදුන 'ශ්‍රීපාදස්ථානය' නමින් අතිශය පූජනීය ස්ථානයක් බවටපත් කිරීම පමණක් නොව අනුරාධපුරයේ ශ්‍රී මහා බෝධීන් වහන්සේ ප්‍රධානකොට ගත් සියලුම පාහේ වෙහෙර විහාර ඉදිකිරීමේ මූලාරම්භය සලකුණු කිරීම් හේතුකොට බුදුරජාණන්වහන්සේ මෙරට ජීවමානව වැඩ සිටිනවා බඳු වැදගත්කමක් ජනිත වී ඇත.

මෙම තත්ත්වය යටතේ ලක්දිව තුල බුදු දහම ස්ථාපික කිරීමට බුදුරජාණන්වහන්සේ ජීවමානව වැඩසිටි කාලයේදීම උන්වහන්සේ විසින් සැළසුම් කළ බව දැකිය හැකිය. බුදුරජාණන්වහන්සේ පරම ශාන්ති සංඛ්‍යාත පරිනිර්වාණ අවස්ථාවට වැදහොත්ව සිටියදී රැස්ව සිටි දේව සභාවේ නායක සත් දෙවිඳුන් අමතා මතු අනාගතයේ තම සසුන ලක්දිව ස්ථාපිතවන බවට කළ ප්‍රකාශයෙන්ද ඒ බව පැහැදිළි වේ. උන්වහන්සේගේ එකී අවසාන අවස්ථාවේ පවා විජය කුමාරයා ඇතුළු 700ක පිරිසක් ලක්දිවට පැමිණෙන බවද ඔවුන් ආරක්ෂා කරන ලෙස සක් දෙවිඳුගෙන් ඉල්ලා සිටි බව ද ඒ අනුව ක්‍රියාත්මක වූ සක්දෙව් තෙමේ උපුල්වන් දෙවියන්ට ලංකාද්වීපය ආරක්ෂා කිරීමේ කාර්ය පැවරූ බවද මූලාශ්‍රාවල දැක්වේ. ඒ අනුව ලක්දිවට

පැමිණි උපුල්වන් දෙවියන් පරිබ්‍රාජත වේශයෙන් විජය ඇතුළු පිරිසට පිරිත් නූල් ගැට ගසා ආරක්ෂාව සැළසූ ආකාරයද එකී මුලාශ්‍රය වල දැක්වේ.

ඒ අනුව බුදුරජාණන්වහන්සේගේ පරම පිවිතුරු ධර්මීය ස්ථාවර ලෙස මුල්බැස ගන්නා දේශය ලක්දිව බවට උන්වහන්සේ තුල ගොඩනැගී තිබූ විශ්වාසය සාර්ථක කර ගැනීමට තෙවරක්ම ලක්දිවට වැඩම කිරීමද දඹදිව වැඩසිටියදී වුවද ඒ පිළිබඳව අවධානයෙන් සිටි බවද පිරිනිවන්පෑ අවසාන අවස්ථාවේ පවා ඒ සඳහා විධි විධාන යෙදූ බවද පැහැදිළි වන අතර එකී උත්සාහයන්ගේ සහ ඒ අනුව ක්‍රියාත්මක වූ පසු කාලීන වැඩ සටහන් වලද ප්‍රතිඵල ලෙස පසුගිය වසර 2600ක් ඉක්මවා ලෝකයේ ශ්‍රේෂ්ඨතම බෞද්ධ රාජ්‍යය ලෙස ලක්දිව ප්‍රචලිතව පවතින බවද පැහැදිළිය.

**සාහිත්‍යශූරී**

**සම්මානිත මහාචාර්‍ය්‍ය**

**මාලනී ඇඳගම**



## වෙසක් පොහොයේ වැදගත්කම

බුදු රජාණන් වහන්සේගේ තෙමඟුල සිදුවීම.

සුමේධ තාපසතුමා දීපංකර බුදුරජාණන් වහන්සේගෙන් නියත විවරණ ලැබීම.

සතර පෙර නිමිති වල ව්‍යාධි රූපය දැකීම.


යමා මහා පෙළහර පෑම.


ආනන්ද මහරහතන් වහන්සේ පිරිණිවන් පෑම.

බුදුරජාණන් වහන්සේගේ තෙවන ලංකාගමනය සිදු වීම.

විජය කුමරුගේ ලංකාගමනය.

දේවානම්පියතිස්ස රජුගේ දෙවන රාජාභිෂේකය.





# බුදු නෙතින් විවරණ දුන් පංචවිධ සංකල්පය

වෛද්‍ය ඉන්ද්‍රාණි රත්නායක

රැයේ උපන් සීතල පිණි බිඳු තණපත් අග මැවූ මුතු කැට වියැකී යමින් පවතී. සියොතුන්ද, බිඟුන්ද මවන ඉමිහිරි නාද රටා සවන් සනසයි. හිමිදිරි උදෑසන තුරු හිස් මත විකසිත වන නෙක පැහැ කුසුම් සිප ගනිමින් ළහිරු පෙරදිගින් එබිකම් කරනුයේ නව දිනයකට කවුළු පියන්පත් විවර කරමිනි.

නව දිනක්. ඔව් නව දිනක් යනු බලාපොරොත්තු ගොන්නකි. ඒ එළඹෙන නව දිනයේ එම බලාපොරොත්තු මල්පල ගන්නට නම් සිතුවිලි පහන් විය යුත්තේ මෙසේ යයි මටම කියන්නාක් මෙන් ගුවන් විදුලියෙන් ඇසෙන්නට වූයේ ගාථා රත්නයකි.

'උට්ඨාන මතෝ සතිමතෝ

සුචිකම්මස්ස නිසම්මකාරිනෝ

සඤ්ඤතස්සච ධම්මජීවිනෝ

අප්පමත්තස්ස යසෝභි වඩ්ඪති
'

ගාථාව දේශනා කළ භික්ෂූන් වහන්සේ එය සරල බසින් පැහැදිළි කරන සේක්, එය මගේ හිතේ තදින් සනිටුහන් විය.

උත්සාහ වන්ත, එළඹ සිටි සිහිය ඇති, විමසා බලා ක්‍රියා කරන, හික්මුණු, ධාර්මික, අප්‍රමාද පුද්ගලයාගේ යසස වර්ධනය වන්නේය.

අප තිලෝගුරු බුදු පියාණන් වහන්සේ වසර දෙදහස් පන්සියයකට එපිට දෙසා වදහල ඒ දහම අදටද මනාව ගෝචර වන බව නොකිව මනාය. සදහම අකාලික වන්නේ එබැවිනි.

අප්‍රමාදී පුද්ගලයා ලොව කොතැන කවදා කෙසේ වුවද යසස ලබයි. ඒ බුදු වදනයි. සනාතන සත්‍යයයි. උත්සාහය, එළඹ සිටි සිහිය, හික්මුණුබව, මෙන්ම කටයුත්තෙහි අනලස්බව ඇති කර ගැනීම ජීවිතය ජය ගැනීමකි. මේ බුදු වදනෙහි කැටිවුනු දියුණුවේ මංපෙත සකුරා මල් පිපෙන ජපානයෙන් නැවතත් විකසිතව පංචවිධ සංකල්පය හෙවත් 5S (එස් පහ) ලෙසින් කරළියට බැස ලොව පුරා සංක්‍රමණය කර ඇත.

කොරොනා වෛරසය ලොව පුරා වේගයෙන් පැතිර යයි. කොරෝනාවෙන් අකර්මන්‍ය වූ ලොව නැවත ප්‍රතිසංස්කරණය කිරීමෙහිලා පුරෝගාමී මෙහෙවරක් මෙම පංචවිධ සංකල්පයට කළ හැකි බව මට නම් සක්සුදක් සේ පැහැදිලිය.

'ජීවිතය රෝස මල් යහනාවක් නොවේ ' යයි කියමනක් ඇත. පසුගිය දිනවල අප මුහුණ දුන් කටුක අත්දැකීම් එය පසක් කළේය. එය වුවද පැමිණි දුක් පැණි රසයි කියමින් යහපතට හරවාගෙන අපි මනා කායික හා මානසික විවේක සුවයක් අත් වින්දෙමු. එපමණක් නොව ගෙවතු වගාවටද, සම්පත් ඉපැයීමටද, නව නිපැයුම් බිහි කිරීමටද සිතීමට තරම් කාල වේලාවක් ඉන් අප සතුවිය. ශ්‍රී ලාංකිකයන් සැබවින්ම නිර්මාණශීලී බව මා සිහිපත් කරන්නේ ආඩම්බරයෙනි. මගේ අදහස නම් අපට අපේ ජීවිත රෝස මල් යහනාවක් බවට පත් කරගත හැක. ඒ අප ඉහත ගාථා රත්නයෙන් උගත් දෙය ජීවිතයට බද්ධ කර ගැනීමෙනි. පංචවිධ සංකල්පයට අනුගත වීමෙනි.

ජීවිතයේ අනේකවිධ බාධක කම්කටොලු මැද ඉදිරියට යද්දී මද ඉසිඹුවක් ලබන්නට, අපට ඒ සඳහා අවැසි කාලය, ශ්‍රමය සහ ධනය ඉතිරිකර දෙන්නට මේ එස් පහ හෙවත් පංචවිධ සංකල්පයට ඇත්තේ විශ්මිත හැකියාවකි. ඔබත්, නිවසත්, ගමත්,රටත් පමණක් නොව මුළු ලොවම නිවී සැනසිල්ලේ ජීවත් වන පරිසරයක් ගොඩ නගා දීමට මේ සරල

ක්‍රියාකාරකම් පහට හැකි වන්නේ කෙසේදැයි දැන් විමසා බලමු.

ජපන්නු හපන්නුය. දෙවන ලෝක යුද්ධයෙන් අඩියටම වැටී සිටි ජපානයට යලි නැගී සිටින්නට වැඩි කලක් ගියේ නැත. ඒ ඔවුනගේ සාමූහික ප්‍රයත්නයත් පංචවිධ සංකල්පයත් නිසාය.

ඇත්ත වශයෙන්ම දන තුඩ තුඩ මැතිරෙන ඵලදායීතා ශිල්ප ක්‍රම ක්‍රියාත්මක කිරීමට ශක්තිමත් අත්තිවාරමක් අවශ්‍ය වනවා නම් එය වන්නේ මේ පංචවිධ සංකල්පයයි. මෙම අත්තිවාරම මත ඵලදායීතා කුළුණු ගොඩ නගා අප තනන්නේ නිවසක්ද, කර්මාන්ත ශාලාවක්ද, පාසලක්, රෝහලක්ද, වෙනයම් ආයතනයක්ද යන්න අදාළ නැත. අත්වන්නේ යහපත් ප්‍රතිලාභයි. නිසි කළමණාකරණයයි, මනා අන්තර්පුද්ගල සබඳතාවයයි. ආර්ථික, සමාජීය සහ ආකල්ප සංවර්ධනයයි. කාලයේ, ධනයේ, ශ්‍රමයේ ඉතිරියයි.

දැන් අපි මේ අත්තිවාරම අපේ නිවසේ, කාර්යාලයේ, පාසලේ, රෝහලේ,

ගොඩනගා ගැනීම අරඹමු. එය ජපානයේ ඇති වූවාක් මෙන් වේගවත් ජවයක් ඇති කර කාර්යාලයේ, වැඩ පලේ, පාසලේ, රෝහලේ, නිවසේ පිරිස් අතර අන්‍යෝන්‍ය



සබඳතා සවිමත් කරනු ඇත. සියල්ලෝම තම කාර්යය ලෙහෙසියෙන් කෙටි කලකින් ඉටු කරන හොඳම ක්‍රමය එවිට දනී. තම කාර්යයේ ප්‍රතිඵලය පලදායී ලෙස ලබා දෙයි. කාලය. ධනය, ශ්‍රමය කළමණාකරණය මනාව සිදුවේ. අවසානයේ සියල්ලෝම සුවපහසු තෘප්තිමත් ජීවිතයක් ගෙවති.

ඇත්ත වශයෙන්ම ජපන්නු මෙම සංකල්පය වැඩිපුරම යොමු කර ඇත්තේ ඔවුන්ගේ නිෂ්පාදන ප්‍රතිලාභ උපරිමයෙන් නංවා ගැනීම සඳහාය. පංචවිධ සංකල්පය ලෝ පුරා මෙතරම් ප්‍රචලිත ඉවහල් වී ඇත්තේ ද නිවසේ වේවා, කම්හලේ වේවා, පාසලේ, ගොවිබිමේ වේවා ඵලදායීතාවය සියයට සියයක්ම නංවා දීමට එහි ඇති සමත් බවයි. කර්මාන්තයක් උදෙසා යොදවන ප්‍රාග් ධනය, මානව සම්පත, හෝ යන්ත්‍ර සූත්‍ර ගොඩනැගිලි ආදියෙහි සංඛ්‍යාත්මක වැඩිකිරීමක් නොකර සියයට දෙසියයක නිෂ්පාදන ධාරිතාවයක් ලබා දීමට පංචවිධ සංකල්පයට පමණක් හැකි වීමයි.

වර්තමානයේ කෝවිඩ් 19 ආසාදනය නිසා ලොව පුරා නිෂ්පාදන ධාරිතාව පසුබැස ඇත. මින් ගොඩ ඒමට පංචවිධ සංකල්පය අනිවාර්යයෙන්ම ලොවට පිහිට වනු ඇත.

මෙතරම් වටිනා ප්‍රතිලාභ රැසක් අත්කර ගැනීමට ඔබ කළ යුත්තේ ඉතාම සරල පියවර පහක් අනුගමනය කිරීම පමණි. ඔබේම නිවස, කාර්යාලය, පංසල, පාසල හෝ වෙනයම් ඕනෑම තැනකින් එය ඔබට ඇරඹිය හැක.

මෙම එස් පහ හෙවත් පංචවිධ සංකල්පය නම්

* සෙයිරි (සංවිධිත බව)

* සෙයිතෝන් (සුපිළිවෙල)

* සෙයිසො (සුපිරිසිදුකම )

* සෙයිකෙත්සු (සම්මිතිය)

* ශිත්සුකේ (ශික්ෂණය)

යනුවෙනි. මේ එස් අකුරින් ඇරඹෙන ජපන් වචන පහකි.

පළමුව සෙයිරි හෙවත් සංවිධිත බව සලකා බලමු. එනම් අවශ්‍ය දෑ,අනවශ්‍ය දෑ වෙන්කර හඳුනාගෙන අනවශ්‍ය දෑ බැහැර කිරීමයි. අනවශ්‍ය දෑ අතර තිබෙන වටිනාකමක් ඇති පරණ පත්තර වැනි දේ විකුණා මුදල් කළ හැක. තමන්ට අනවශ්‍ය වුවත් වෙනත් කෙනෙකුට ප්‍රයෝජනවත් වන දෑ ප්‍රමාණයෙන් කුඩා වූ පාවහන්,

ඇඳුම් වැනි දෑ) ඔවුනට පරිත්‍යාග කළ හැක. සෙස්ස සුදුසු පරිදි අතු ගා ගිණි තබා හෝ වළ දමා පරිසයෙන් ඉවත්කර ගන්න. අනවශ්‍ය වුවත් සිහිවටන වැනි දේ ගබඩා කර අවහිරයක් නොවන ලෙස තැබිය හැක.

දැන් ඔබ ඉදිරියේ ඇත්තේ අවශ්‍ය දේ පමණි. මෙහිදී කළ යුතු දෙවෙනි එස් පියවර හෙවත් සෙයිතොන් වෙත යාමය. අවශ්‍ය දේ වර්ග කරන්න. ඒ

* නිතිපතා අවැසි දේ,

* ඉඳහිට අවැසි වන දේ

* කලාතුරකින් අවැසි වන දේ වශයෙනි. ඔබේ නිදන කාමරයේ, මුළුතැන්ගෙයි මෙන්ම මුලු නිවස පුරා ඇති බඩු භාණ්ඩ මෙලෙස අස්පස් කර වෙන් කර ගෙන පවුලේ සියලු දෙනාගේ සහභාගීත්වයෙන් මෙම පියවර අනුව පියනගන්න. අත්වන පහසුව මානසික සුවය අත්විඳින්න.

දැන් කළයුත්තේ රැස් කරගත් අවශ්‍ය දේ නිසි පිළිවෙලට ඇසිරීමයි. මෙයින් ඒවා පරිහරණයට ගැනීමේදී අපේ මහඟු සම්පතක් වන කාලය ඉතිරි කරගෙන මනා කළමණාකරණයකින් වැඩ කටයුතු කරගෙන යාමට අපට හැකි වනු ඇත.

*නිතිපතා අවැසි දේ අත පොවන දුරකින් ද



*ඉඳහිට අවැසි වන දේ නෙත ගැටෙනා මානයේ ඇතුළතින් ද

*කලාතුරකින් අවැසි වන දේ අවහිරයක් නොවන ලෙස වඩාත්ම ඇතුළතින් ද වශයෙන් ගබඩා කළ යුතුය.

මෙහිදී

* සෑම භාණ්ඩයකටම නිශ්චිත ස්ථානයක් වෙන් කිරීම

* භාණ්ඩ ලේබල් කිරීම

*පහසුවෙන් ලඟා විය හැකි අයුරින් තැබීම

මගින් ඔබේ රන් හා සමාන කාලය ඉතිරි වී ඔබට ප්‍රිය මනාප පරිසරයක් ද අත්වනු ඇත. කරන කටයුතු වල ඵලදායීතාවය සහ කාර්යක්ෂමතාවය වැඩි වනු ඇත.

සෙයිසො හෙවත් සුපිරිසිදුකම අනුගමනය කළ යුතු වන්නේ වෙන් කළ සියලු භාණ්ඩ නිසි ලෙස ස්ථානගත කිරීමෙන් පසුවය. කුණු දූවිලි බිඳක් හෝ ඉතිරි නොවන ලෙස අතුගා, පිසදමා, කැඩුනු බිඳුණු තැන් පිළිසකර කොට ප්‍රියමනාප ලෙස සකසාගත යුතුය. කාලසටහනක් සකසා ගෙන නිරන්තරයෙන් අතුගෑම, පිසදැමීම සහ සොයා බැලීම තුලින් ඉදිරියට නඩත්තුව පවත්වාගෙන යාම සාමූහික වගකීමකි. දැන් එදිනෙදා කටයුතු කරගෙන යාම සඳහා ඔබට වැඩි ආයාසයක් ගත යුතු නොවනු ඇත. කාලය, ශ්‍රමය වැයකරමින් අවතැන් වූ දේ සෙවීමට සිදු නොවනු ඇත.

සෙයිකෙත්සු හෙවත් සම්මිතිය සිව්වන පියවරයි. මෙහිදී මෙතෙක් අනුගමනය කළ පියවර තුන අඛන්ඩව පවත්වාගෙන යාම, වැඩි දියුණු කිරීමයි නිරන්තරයෙන් ප්‍රගතිය පරීක්ෂා කිරීම, මෙන්ම දිරි ගැන්වීම, අගය කිරීම මගින් ඉහල කළමණාකාරීත්වය සාමාජිකයන් මෙහෙයවිය යුතුය. කැපවීමෙන් කටයුතු කරන්නන්ට ත්‍යාග හා පදක්කම් ප්‍රදානය, ප්‍රසංශා කිරීම. වටී.

අවසාන හෙවත් පස්වන පියවර වන්නේ නිරන්තරයෙන්, නිරායාසයෙන්, විනයානුකූලව පංචවිධ සංකල්පය අනුගමනය කිරීම ජීවිතයට බද්ධ කර ගැනීමයි. එය සමාජගත කිරීමයි. අන් අය දැනුවත් කර දිරිගැන්වීමයි.

අප තිලෝගුරු බුදු පියාණන් වහන්සේ සංඝයා වහන්සේලා අරභයා දෙසා ඇති විනය නීති මගින් තමා භාවිතා කරන වැසිකිළි කැසිකිලි ඉන් පිටතට යාමට පෙර ඊලඟට

# බෞද්ධාලෝකය

පැමිණෙන්නාට පිළිකුලක් ඇති නොවන ආකාරයට පිරිසිදු කළ යුතු බවත්, තමා පරිහරණය කරන සෙනසුනෙන් බැහැරව යාමට පෙර එය හොඳින් පිරිසිදු කර, භාවිතා කළ බඩු භාණ්ඩ නිසි ලෙස ස්ථානගත කිරීම කළ යුතු බවටත් විනය නීති පනවා ඇත. මෙතැන උගන්වා ඇත්තේ ෂිත්සුකේ - ශික්ෂණය මිස අන් කිසිවක් නොවේ.

මේ සියල්ල ඔබගේ හැම වැඩ කටයුත්තකම ඵලදායීතාවය ,ගුණාත්මක භාවය, සුරක්ෂිතතාව වැඩි කරනවා පමණක් නොව ඔබ සපයන භාණ්ඩ හා සේවා ලබාදීමේදී වැයවන කාලය. ශ්‍රමය හා ධනය ඉතිරි කර පිරිවැය අඩු කර දෙනු ඇත. නිවසේ, සේවක මඩුල්ලේ චිත්ත ධෛර්යය වැඩි කරනු ඇත

මනෝ පුබ්බංගමා ධම්මා

මනෝ සෙට්ඨා මනෝමයා

මනසාචේ පසන්නේන

භාසතිවා කරෝතිවා

තතෝ නං සුඛමංවේති

ඡායාව අනපායිනී

මේ බුදු වදන ඔබ අසා ඇතිවාට සැක නැත. මෙයින් කියැවෙන්නේ අප විසින් ඉටුකරන කවර කටයුත්තකදී වුව මනසම මුල් වන බවයි. ප්‍රසන්න සිතින් යුතුව (මනසාවෙ පසන්නේන) කියන, කරන දෙය (භාසතිවා කරෝතිවා) තමාට යහපත පිණිස තමා අත් නොහැර පැමිණෙන බවයි. ඒ කෙසේද යත් තමා අත නොහැර පසුපස පැමිණෙන සෙවනැල්ල මෙන් (ඡායාව අනපායිනී) කළ හොඳ නිරන්තරයෙන් සතුට රැගෙන එන බවයි. යහපත් සිතින් අප කළ කී දේවල ප්‍රතිඵල ඔබට මට පමණක් නොව සමස්ත මානව වර්ගයාගේම යහපත පිණිස පවතිනු ඇත. මෙයින් සිරුර ලෙඩ කරවන කුණු ,දූවිලි, අපද්‍රව්‍ය වලින් තොර වාසයට හිතකර වටපිටාවක් ඇතිකර කෝවිඩ් 19 වෛරසයද මෙලොවින් තුරන් කරනු ඇත.

අළුයම වැටෙන පිනිබිඳ තණපත් මත සිත්තම් කළ මුතු අහුර හිරු දුටු සැනින් වියැකී ගියද ඔබ ඔබේ දිවියට පුරුදු පුහුණු කරගත් සෙයිරි, සෙයිතොන්, සෙයිසො, සෙයිකෙත්සු, සහ ෂිත්සුකේ කිසිදිනෙක ඔබේ හදවතින් වියැකී යනු නැත. ඉහත ධම්මපද ගාථාවෙහි සඳහන් වූවාක් මෙන් ඔබ අත් නොහැර පැමිණෙන සෙවනැල්ල මෙන් මෙම පංචවිධ සංකල්පයෙන් ඔබ අත්පත් කරගත් ප්‍රතිලාභ, ඉන් ලබන මානසික, කායික අස්වැසිල්ල ඔබ හැර නොයනු ඇත.

ඔබට පමණක්ද, නැත. ඔබගේ දූ දරු, නෑදෑ හිත මිතුරු, අසල්වැසියන්, සියල්ලන්ටම ද, ඔබගේ කාර්යාල සේවක මඩුල්ලට මෙන්ම විශේෂයෙන් ඔබගේ සේවා ලාභීන්ට ද එහි ප්‍රතිලාභ නොඅඩුව ලැබෙනු ඇත. මේ සියල්ලෙහි අවසාන ප්‍රතිඵලය වශයෙන් සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක්, තෘප්තිමත් රට වැසියන් පිරිසක්, නීරෝගී ජනතාවක් මෙන්ම ජීවත් වීමට සුන්දර පරිසරයක් අපට උරුම වනු ඇත

මේ ප්‍රතිලාභ සියල්ල උරුම කරගනුවස් පංචවිධ සංකල්පය සමග අත්වැල් බැඳ ගැනීමට අපි අදිටන් කර ගනිමු.

වෛද්‍ය ඉන්ද්‍රාණි රත්නායක



පසුගිය කලාපයෙන්.............

# ථේරවාදී භික්ෂු අධ්‍යාපනය

මහාචාර්ය කොන්ගස්තැන්නේ ආනන්ද හිමි



‘මගධ බසින් වැටෙමින් ආ බුදුකැලි අටුවා හෙළ දිව ඇජොරො හෙළදිව බසින් තැබූහ’. (ධම්පි. 6පිටුව), ‘සළිත්ථක සිප්පේ, පයත් හකුරුලන සිප්හි, හෙළ අටුවායෙහි, සාළින්තහක් කරනලනක සිපැයි යෙත්’ (ධම්පි.136), මහඅට්ඨකථා, මහාපච්ඡරී ආදී කෘතිවල ‘සීහළ අට්ඨකථායො අකංසු’. (විමති විනෝදිනී ටීකා 6 පිටුව) ආදී වශයෙන් හෙළ අටුවා ගැන සඳහන් වේ. ඒ හෙළ අටුවා ආශ්‍රය කරගෙන පස්වන ශතවර්ෂයේ දී පමණ බුද්ධඝෝෂ හිමි, ධම්මපාල හිමි, බුද්ධදත්ත හිමි ආදී වියතුන් විසින් පාලි අට්ඨකථා සංස්කරණය කරන ලදී. එය සමන්තපාසාදිකා විනයට්ඨකථාවේ මෙසේ සඳහන් වේ.

‘සංවණ්නනා සීහළදීපකෙන වාකොයන එසා එලසංඛටත්තා න කිඤ්චි අත්ථං අභිසම්බුනාති දිපන්තරෙ භික්ඛු ජනස්ස සම්මා

තස්මා ඉමං පාලිනයානුරූපං සංවණ්ණනාදානි සමාරභිස්සං

අජ්ඣෙසනං බුද්ධසිරිව්හයස්ස ථෙරස්ස සම්මා සමනුස්සරන්නෝ

සංවණ්ණනං තං ච සමාරභන්තො තස්සා මහා අට්ඨකථං සරීරං

කත්වා මහාපච්චරියං තථෙව කුරුන්දි නාමාදිසු විස්සුතාසු’. (සම 2 පිටුව)

‘සිංහල භාෂාවෙන් සකස් කරන ලද අටුවාවලින්, පිටරටවලින් පැමිණෙන භික්ෂූන්ට ප්‍රයෝජනයක් නැත. එමනිසා මේ හෙළ අටුවාවන් පාලි භාෂාවට පරිවර්තනය කිරීම ආරම්භ කරමි. එහිදී බුද්ධසිරි ආදී තෙරවරුන්ගේ අපේක්ෂාවන් හොඳින් සිහිපත් කරන්නෙමි. මහා අට්ඨකථාව, මහාපච්චරියට්ඨකථාව, කුරුන්දි අට්ඨකථාව ආදී ප්‍රසිද්ධ හෙළ අටුවා මූලිකත්වයේ තබාගෙන හෙවත් ශරීරය සේ සලකා එය ආරම්භ කරමි’.

ඒ පාලි අට්ඨකථා අතරත් වඩාත් පැරණි අට්ඨකථාව සේ සැලකිය හැකි වන්නේ කංඛාවිතරණී නාම මාතිකට්ඨකථාවයි. එය පාතිමොක්ඛයට ලියූ අට්ඨකථාවයි.

පාතිමොක්ඛය, යනු පාරාජිකා පාළි, පිචිත්තිය පාළි, පරිවාර පාළි යන විනය පෙළ පොත් තුනේ අන්තර්ගත ශික්ෂා පදවල එකතුවයි. එය මාතිකා පාළිය, පාතිමොක්ඛයැයි ද හැඳින්වේ. පාතිමොක්ඛය යනු විනය පිටකයේ සාරයයි. එහි පාරාජිකා, සංඝාදිසේස, අනියත, නිස්සග්ගිය පාචිත්තිය, පාචිත්තිය, පාටිදේශනීය, සේඛියා, අධිකරණ හා අධිකරණ සමථ යන මාතෘකා යටතේ ශික්ෂාපද

සංග්‍රහ කර ඇත. භික්ෂූන් වහන්සේලා ආරක්ෂා කළ යුතු ප්‍රධාන ශික්ෂාපද සංග්‍රහය, භික්ඛු පාතිමොක්ඛය වශයෙන්ද භික්ෂුණීන් ආරක්ෂා කළ යුතු ශික්ෂාපද සංග්‍රහය, භික්ඛුනී පාතිමොක්ඛය වශයෙන්ද හැඳින්වේ. මේ පොත් දෙකට, උභය පාතිමොක්ඛයැයි ද කියයි. භික්ඛු පාතිමොක්ඛය, සියලුම භික්ෂූන් විසින් ද භික්ඛුනී පාතිමොක්ඛය, භික්ෂුණීන් වහන්සේලා විසින් ද කටපාඩම් කරන, පෝය දිනවල දී සීමාවට රැස්වී කියවන පාඨග්‍රන්ථ දෙකකි. එනිසා එය හත්තසාර වස්තුවක් සේ භික්ෂූන් විසින් උභය පාතිමොක්ඛය ආරක්ෂා කරනු ලැබේ.

මිහිඳු මහරහතන් වහන්සේ වැඩ සිටි කාලයේ දී පාතිමොක්ඛයෙහි දැක්වෙන ශික්ෂාපදවලට විස්තරයක් හෙළ බසින් අරිට්ඨ මහරහතන් වහන්සේ ප්‍රධාන සීහළ භික්ෂූන් විසින් සකස් කරන්නට ඇත. ඒ හෙළ පාමොක් අටුවාව (සීහළ පාතිමොක්ඛට්ඨකථාව), මහාවිහාරීය භික්ෂූන් විසින්



කටපාඩමින් ආරක්ෂා කරන ලදී. හෙළබසින් පැවති, හෙළ පාමොක් අටුවාව,කංඛාවිතරණී නමින් පාලි භාෂාවට නැඟූ බව මාතිකට්ඨකථාවේ ආරම්භක ගාථාවල මෙසේ සඳහන්වේ.

‘ මහාවිහාරවාසීනං වාචනාමග්ගනිස්සිතං කථයිස්සාමි නාමෙන කංඛාවිතරණිං සුභන්ති’, (කංඛා. හේව. 2014. 1. පිටුව)

‘මහාවිහාරවාසීන්ගේ වචන මාර්ගයෙන් පැවත එන්නා වූ හෙළ බසින් හොඳින් ආරක්ෂා කරන ලද ( හෙළ පාමොක් අටුවාව) මාතිකට්ඨකථාව හෙවත් කංකාවිතරණීය කියන්නෙමි’.

මෙසේ හෙළ අටුවාවක්ම ඇසුරු කරගෙන කංඛාවිතරණී නාම මාතිකට්ඨකථාව පාලියට නගන ලද්දේ අනුරාධපුර යුගයේ මුල් භාගයේ දීය. ඒ හෙළ පාමොක් අටුවාව හෙවත් මාතිකට්ඨකථාව ද පාරාජිකා පාළි, පාචිත්තිය පාළි, පරිවාර පාළි, චුල්ලවග්ග පාළි, මහාවග්ග පාළි යන විනය පෙළ පොත් ද ඇසුරු කරගෙන, ව්‍යවහාර වර්ෂ පස්වන ශත වර්ෂයේ දී අනුරාධපුර මහා විහාරයේ දී බුද්ධඝෝෂ හිමියන් විසින් සමන්තපාසාදිකා නාම විනයට්ඨකථාව ලියන ලදී. මේ කාලයේ දීම බුද්ධදත්ත හිමියන් විසින් මාතිකට්ඨකථා ටීකාවත් විනය විනිච්ඡයත් උත්තර විනිච්ඡයත් රචනා කරන ලද බව වංශකථාවල සඳහන් වේ. අනුරාධපුර යුගයේ මුල් කාලයේ වැඩසිටි මහාසාමි හිමියන් විසින් මූළ සික්ඛාවත්, ධම්මසිරි හිමියන් විසින් කුදුසික පුරාණ සන්නයක් හා පැරණි කුදුසික පදාර්ථ වර්ණනාවක් ද ඇසුරු කරමින් බුද්දක සික්ඛාවත් රචනා කරන ලදී. මේ කාලයේ දීම මූළ සික්ඛාව, මුල්සික වශයෙන් ද බද්දක සික්ඛාව,කුදුසික වශයෙන් ද හෙළ බසට පරිවර්තනය කෙරිණි.

මේ ග්‍රන්ථ දෙකත් පාතිමොක්ඛයත් ඇසුරු කරගෙන සිඛවළඳත්, සිඛවළඳ විනිසත් අනුරාධපුර යුගයේ දීම රචනා විය. සිඛවළඳ, සික්ඛාපද වළඤ්ජනී නමින් පාලි භාෂාවට පරිවර්තනය කෙරිණ. දොළොස්වන ශතවර්ෂයේ දී සාමණේර භික්ෂූන් සඳහා හෙරණසික හා හෙරණසික විනිස ලියවිණ. බුද්දකපාඨයේ සාමණේර පඤ්හය ඇසුරින් සාමණේර ප්‍රශ්නයත් රචනා වී ඇත්තේ පොළොන්නරු යුගයේ දීය. ඒ කාලයේ පොළොන්නරුවේ වැඩසිටි ටීකාචාර්ය ශාරිපුත්‍ර හිමියන් විසින් විනය සාරත්ථදීපනිය, සමන්තපාසාදිකා සන්නය සහ විනය ටීකා ග්‍රන්ථ රාශියකුත් රචනා කරන ලදී. පොළොන්නරු යුගයේ අග භාගයේ සිටි බුද්ධදත්ත හිමියන්ගේ ප්‍රාතිමෝක්ෂ සන්නය, විනය සාහිත්‍යයට එක් වූ සන්න ග්‍රන්ථයකි. කර්තෘ අවිනිශ්චිත කංඛාවිතරණී පිටපොතත් රචනා කර ඇත්තේ දොළොස්වන ශත වර්ෂයේදීය. දඹදෙණියේ රජ කළ දෙවෙනි පණ්ඩිත පරාක්‍රමබාහු රජු විසින් ලියන ලද කංඛාවිතරණී සන්නය නම් වූ ප්‍රාතිමෝක්ෂ අටුවා සන්නයත් , කුදුසික පදාර්ථයත්, සමන්තපාසාදිකාවේ විකාල භෝජන සික්ඛාපදය විස්තර කෙරෙන අටුවාව ඇසුරින් රචනා කර ඇති ‘ කැලි සන්නය’ හෙවත් ‘කැලි සමුච්චය නම් වූ විනය සන්නයත් දඹදෙණි යුගයේ මුල් භාගයේ දීම ලියැවිණ.

මෙසේ විනය සාහිත්‍ය සංවර්ධනයටත් භික්ෂු අධ්‍යාපනයටත් සම්බන්ධ විනය ග්‍රන්ථ රාශියක් ලිය වී ඇත. කුදුසික ටීකාව (පොළොන්නරුවේ සංඝරක්ඛිත හිමි), පාළිමුත්තක විනය විනිච්ඡය සංග්‍රහය (පොළොන්නරුවේ ජේතවනාරාමයේ සිටි භික්ෂුවක්),සීමාලංකාර හා සිමාලංකාර සංග්‍රහය( පොළොන්නරුවේ වාචිස්සර මහාසාමි), ආපත්ති දීපනී, සීමාලක්ඛණදීපනී, සීමානය ආදී ග්‍රන්ථත්, විනය සාහිත්‍යයට අයත් වේ.

මෙසේ ලාංකේය ථෙරවාදී භික්ෂූන් විසින් අනුරාධපුර, පොළොන්නරු යගවල දී විනය අධ්‍යයනට සහ විනය අධ්‍යාපනයට වැඩි අවධානයක් යොමු කිරීම, භික්ෂු ශාසනයේ ආරක්ෂාවට හේතු විය. එහෙත් දඹදෙණි යුගයේ දී විනය අධ්‍යයනය දුර්වල වූ අතර ධර්ම-ශාස්ත්‍රීය අධ්‍යයනය වර්ධනය විය. එකල පැවති අෂ්ටායතනවලින් දිරිගැන්වූයේ ධර්ම, ශාස්ත්‍ර අධ්‍යයනටය, වියතුන්ගේ අවධානයත් විවිධ විෂයන් සහ ශිල්ප ශාස්ත්‍ර අධ්‍යයනට යොමු වූ බව අෂ්ටායතනවලින් ඇති වූ ශාස්ත්‍රෝන්නතියෙන් ද පැහැදිලි වේ. දඹදෙණි යුගයේ දී පාලි, සංස්කෘත, සිංහල භාෂාත්‍රයෙන් ම ධර්මය, සාහිත්‍යය, ව්‍යාකරණ, ග්‍රන්ථ රාශියක් ගද්‍ය -පද්‍ය දෙකින්ම ලියැවීමෙන් සනාථ වී ඇත.



තවත් කොටසක් ලබන කලාපයට

## බුදු දහම වෙනුවෙන් මහඟු සේවයක් ඉටු කරන මහාචාර්ය සුසිරිපාල මාලිම්බඩ මහතා කලාභූෂණ රාජ්‍ය සම්මානයෙන් පිදුම් ලැබූ වගයි.....!



ලිවීම, ඇඳීම, සහ චිත්‍රය සමඟ අපි කුඩා කල සිටම බද්ධ වූවෝ වෙමු.එය වැඩි දුරටත් අර්ථවත්ව සොයා බැලීමට කුඩා කළ සිට අවශ්‍ය වූවක් විය.

නිතර නිතර චිත්‍රය,මූර්තිය හා විවිධ කලාවන් සැබැදි අළුත් අළුත් දේ සෙවීමේ නිරත වූ මොහු පාසලේ දී හා ඉන් පිටතදීත් චිත්‍රයේ රසය, අන්තර්ගතය හා නිර්මාණාත්මක ලක්ෂණ සොයා යන කෙනෙක් විය.එහි ප්‍රතිඵලය ලෙස නැවතුනේ ශ්‍රී ලංකා ජාතික කලායතනයේ ය. වසරකින් එය කැළණිය විශ්වවිද්‍යාලයට අයත් විය.සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ උපාධිය හැදෑරීමෙන් පසු එහිම ආචාර්ය මණ්ඩලයට ඇතුලත්ව ආ ගමන් මහ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයෙකු දක්වා පියවර තැබීමක් විය.

උපන් ගම ගාල්ලට ඇත වදුරඹය.පාසල් අධ්‍යාපනයට සෙවණ දුන්නේ වදුරඹ මධ්‍ය මහා විද්‍යාලයයි. පාසල් ජීවිතයේ මුල් අවධියේදී ම කලාවට අත්පොත් තැබූ මාලිම්බඩ මහතා කලාවේ අපූර්වත්වය සොයා කොළඹට පැමිණියේ 1973 වසරේදී ය. කැළණිය සෞන්දර්ය අධ්‍යයන ආයතනයෙන් ප්‍රථම උපාධිය ගෞරව සාමාර්ථයක් සමඟ සමත් වීමෙන් පසු එහිම ආචාර්ය මණ්ඩලයට ඇතුලත් කරගත්තේය.1983 දී පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්වයක් යටතේ ඉන්දියාවේ බැරෝඩා විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධිය ලැබීය. එය මාලිම්බඩ මහතාගේ ගමන් මගේ හැරවුම් ලක්ෂ්‍යය විය. 1985 දී සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ චිත්‍ර හා මූර්ති කලා අධ්‍යනාංශයේ අංශාධිපතිවරයා බවට පත් විය.ශ්‍රී ලාංකික චිත්‍ර,මූර්ති හා කලා ශිල්පයන් හි ප්‍රමුඛතම ආයතනය වූ සෞන්දර්ය අධ්‍යයන ආයතනය 2005 දී සෞන්දර්යය විශ්වවිද්‍යාලය බවට පත්විය.මෙරට උසස් අධ්‍යාපනයට නව සංකල්පයක් එක් කරමින් බිහි වූ සෞන්දර්යය කලා විශ්වවිද්‍යාලය දෘශ්‍ය කලාවේ විවිධ ක්ෂේත්‍රයන් හි ස්ථාවර අධ්‍යාපන ප්‍රමිතියක් ඇති කළේය.ප්‍රධාන විෂයයන් කිහිපයක පමණක් සීමා වී පැවැති දෘශ්‍ය කලා ක්ෂේත්‍රය පුළුල් කරමින් බිහි වූ දෙපාර්තමේන්තු අතරට මුද්‍රණ චිත්‍ර කලා දෙපාර්තමේන්තුවද අයත් විය. ජාත්‍යන්තර වශයෙන් දෘශ්‍ය කලා විෂයෙහි ප්‍රධාන විෂය ධාරාවක් වූ මුද්‍රණ චිත්‍ර කලාව සඳහා දෙපාර්තමේන්තුවක් පිහිටුවීම මාලිම්බඩ මහතාගේ දැඩි උත්සහායේ ප්‍රතිඵලයකි.මෙරට උසස් අධ්‍යාපනයේ දෘශ්‍ය කලාවේ ප්‍රධාන විෂයන් ලෙස මෙම විෂය ස්ථාපිත කිරීමට අවස්ථාව ලැබීම සමස්ත කලා ක්ෂේත්‍රයටම අනුප්‍රාණයකි.

දීර්ඝ කාලීනව පැවැති කලා සම්ප්‍රදායෙන්ගෙන් ඔබ්බට ගොස් විවිධ තාක්ෂණික ආශ්වාදයන් විධිමත්ව පෙළ ගැස්විය හැකි කලා මාධ්‍යක් වූ මුද්‍රණ චිත්‍රයෙන් කලා අධ්‍යාපනයේ නව මානයන් හඳුනා ගැනීමට අවස්ථාව උදා කරලීමට හැකි වීම සුවිශේෂී ජයග්‍රහණයක් ලෙස මාලිම්බඩ මහතා සලකයි.

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයෙ හි 2006- 2009 දක්වා දෘශ්‍ය කලා පීඨාධිපති ධූරයත් ඉන් පසු අවස්ථා කිහිපයකදී ම එම තනතුරේ වැඩ බැලීම හා මුද්‍රණ කලා අධ්‍යනාංශයෙ හි සහ දෘශ්‍ය සන්නිවේදන සැලසුම් අංශයෙහි අංශාධිපති ධූර දීර්ඝ කාලයක් දැරීමත්, එම විශ්වවිද්‍යාලයෙහිම කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂක ධූරය

දැරීමත් ආයතනික වශයෙන් සේවාදායකත්වය ලබාදීමට පිටුවහලක් විය.වසර 30ක සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ ඉටු කරන ලද සේවයට අමතරව මොරටුව, කැළණිය,යාපනය, අග්නිදිග ආදී විශ්වවිද්‍යාලයන් හි සහ මඩකලපුව සමාධි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය, යාපනයේ විශ්වවිද්‍යාලයේ රාමනාදන් ඇකඩමි ආයතනයෙහි සහ ශ්‍රීපාලි මණ්ඩපයේ දී දෘශ්‍ය කලා ක්ෂේත්‍රය වෙනුවෙන් දායකත්වය ලබා දුන්නේය.

මාලිම්බඩ මහතා ජාතික අධ්‍යාපන ආයතනය, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, විද්‍යාපීඨ සහ ගුරුවිද්‍යාලයන් හි විෂය නිර්දේශ උපදේශකවරයෙකු මෙන්ම බාහිර කථිකාචාර්යවරයෙකු වශයෙන්ද සම්පත් දායකත්වය සපයයි.1986 සිට ජාතික ශිල්ප සභාවේ ජනාධිපති සම්මාන මණ්ඩලයේ සාමාජිකයෙක් මෙන්ම දිවයිනේ සියලු පලාත් ආවරණය වන පරිදි කලාව හා කලා ශිල්ප පිළිබඳ දේශකවරයෙකු වශයෙන් ද තම සේවාදායකත්වය ලබා දෙයි.

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ චිත්‍ර හා මූර්ති අනු මණ්ඩලයේ සභාපති වශයෙන් හා සාමාජිකයෙකු වශයෙන් දිගු කලක් කටයුතු කළ අතර දෘශ්‍ය කලා උපදේශක මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් ද කලාත්මක චිත්‍ර සංරක්ෂණ කමිටුවේ සභාපති වශයෙන් ද කටයුතු කරයි.

ජාතික හා ජාත්‍යන්තර චිත්‍ර ප්‍රදර්ශන සඳහා නිරන්තරයෙන් සහභාගී වී ඇති අතර 1990 දී "ග්‍රැෆික්ස් 90" නමින් තම ප්‍රථම ප්‍රදර්ශනය පවත්වා ඇත. දේශීය හා විදේශීය වශයෙන් මෙරට කලා ශිල්පීන්ගේ නිර්මාණ ප්‍රදර්ශනය සඳහා සංවිධානත්වය ලබා දෙමින් අභිරක්ෂක වරයෙකු ලෙස ජාත්‍යන්තර ප්‍රදර්ශන කිහිපයක් සංවිධානය කිරීම සුවිශේෂී වූවකි. මෙහිදී 2008 දී ප්‍රංශයේ පැරිස් නුවර මොනා-බිස්මාක් කලාගාරයේ මාස 3ක කාලයක් පැවති කලා ප්‍රදර්ශනය තුළින් මෙරට ශිල්පීන් 60 දෙනෙකුගේ චිත්‍ර ප්‍රදර්ශනය සංවිධානය කිරීම ඉතාම වැදගත් කරුණකි.

කලාව වෙනුවෙන් අප කැපවී කටයුතු කිරීම මහත් ආශ්වාදයක් ලෙස තෝරා ගැනීම මාලිම්බඩ මහතා තුළ දක්නට ඇති මහාර්ඝ ලක්ෂණයකි. දෘශ්‍ය කලාවේ නව මානයන් අතරින් සමාජ සංවාදයට ඇතුළු වූ මාලිම්බඩ මහතා 2013 වසරේ සිට සංස්කෘති ප්‍රකාශන සංගමයේ සභාපතිත්වය දරන අතර සංස්කෘතික විචාර සංග්‍රහයේ සංවිධායක සංස්කාරක ධූරය ද දරයි. භාෂා ප්‍රේමී සන්ධානයෙහි සභාපති තනතුර ද අධ්‍යාපන හා සංස්කෘතික පදනමෙහි සංවිධායක ලෙස ද තනතුරු දරමින් භාෂා සාහිත්‍යයට ද විශාල සේවයක් මෙතුමාගෙන් ඉටු කෙරේ.

දිවයිනේ කීර්තිමත් සංවිධානයක් වන සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ 2021 වසරේ සිට උප සභාපතිවරයෙකු වශයෙන් හා ජාතික අධ්‍යාපන මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් ද ජාතික ආගමික කටයුතුවල යෙදෙන මෙතුමාගේ සමාජ මෙහෙවරයෙහි විවිධ දිශානතියන් දක්නට ලැබීම සතුටට කරුණකි.

දශක 5කට ආසන්න කාලයක් කලාව, කලා අධ්‍යාපනය, කලා ශිල්ප,භාෂාව හා සාහිත්‍ය වෙනුවෙන් මාලිම්බඩ මහතාගෙන් ලැබෙන සේවාව සුවිශේෂී වූවකි.

459/3 එම්, ජය මාවත, මහරගම පාර, බොරලැස්ගමුව. 0714894925



# රට දැය සුරකින අධිෂ්ඨාන පූජාව ජනගත කිරීම

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය හා ජාතික සංවිධාන ඒකාබද්ධ ක්‍රියාන්විතය සමග සංවිධානය කරනු ලැබූ රට දැය සුරකින අධිෂ්ඨාන පූජාව ජනගත කිරීමේ ආරම්භක වැඩසටහන 2022 අප්‍රේල් 30 වැනි දින පස්වරු 6.00ට බෙල්ලන්විල රජ මහා විහාරස්ථානයේදී බෞද්ධ මහා සම්මේලනයේ ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මහතාගේ ප්‍රධානත්වයෙන් සහ බෞද්ධ සංවිධානවල සහභාගීත්වයෙන් පැවැත්විය. එහිදී විශේෂ අනුශාසනාවක් සිදුකරන ලද්දේ බෙල්ලන්විල රජමහා විහාරාධිපති පූජ්‍ය බෙල්ලන්විල ධම්මරතන ස්වාමීන් වහන්සේ විසින් වන අතර ඊට පසු අධිෂ්ඨාන පූජාව සවස 6.30ට ලබුනෝරුව වනසේනාසනාධිපති පූජ්‍ය කොත්මලේ කුමාර ක්‍යාශප ස්වාමීන් වහන්සේ විසින් පවත්වන ලදී.

මීට සමගාමීව දිවයිනේ විහාරස්ථාන වල මෙම අධිෂ්ඨාන පූජාව මෙදින සිදු කරන්නට විය.



# ජාතික තරුණ මණ්ඩලය මඟින් සංවිධානය කරන ලද දහම් පාසල් ගුරුවරුන් සඳහා නායකත්ව පුහුණු වැඩමුළුව

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ජාතික තරුණ මණ්ඩලය ගරු සභාපති උපේජ් පෙතියාගොඩ මහතා ඇතුළු එම මණ්ඩලය විසින් සංවිධානය කරණු ලැබූ කොළඹ දිස්ත්‍රික් ශාසනාරක්ෂක බල මණ්ඩල තුළ පිහිටි දහම් පාසල් වල ගුරුභවතුන් උදෙසා **"බුදු දහම සිංහලය දේශීය චින්තනයේ අනන්‍යතාවයය"** යන මැයෙන් එක්දින නායකත්ව පුහුණු වැඩමුළුව 2022.03.27 ඉරුදින බෞද්ධ මහා සම්මේලනයේ ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මහතාගේ ප්‍රධානත්වයෙන් සම්මේලන ශාලාවේදී පවත්වන්නට විය.

මෙහිදී පූජ්‍ය මාලේවන ධම්ම විජය ස්වාමීන් වහන්සේ ජනාධිපති නීතීඥ ප්‍රසාන්ත ලාල් ද අල්විස් මහතා ද හිටපු හමුදාපති ජනරාල් දයාරත්නායක මහතා ද නියෝජ්‍ය සභාපති රොෂාන් මද්දුමගේ මහතා විසින් දේශන පවත්වන ලදී.



## අතිපූජ්‍ය මහානායක ස්වාමීන්වහන්සේ බැහැ දැකීම සහ මහනුවර බෞද්ධ නියෝජිත හමුව

බෞද්ධ මහා සම්මේලනයේ ගරු සභාපතිතුමා ඇතුළු කෘත්‍යාධිකාරී මණ්ඩලය 2022-02-26 දින අතිපූජ්‍ය මල්වතු සහ අස්ගිරි මහනායක ස්වාමීන් වහන්සේලා බැහැදැකීම සහ මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලලිත් යූ ගමගේ මහතා වෙත බෞද්ධ හිමිකම් කොමිෂන්සභා වාර්තාව පිරිනැමීම සිදු විය.



මහනුවර දිස්ත්‍රික්කයේ බෞද්ධ නියෝජිතයින් පුහුණු වැඩමුළුවක් ජාතික බෞද්ධ කටයුතු පිළිබඳ විමර්ෂණ මණ්ඩලය විසින් 2022-02-27 වන දින මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පැවැත්විය.



# මහාචාර්ය ගුණපාල පී මළලසේකර මැතිඳුන්ගේ 49 වන ගුණානුස්මරණ වැඩසටහන

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය සහ මළලසේකර පදනම විසින් සංවිධානය කරනු ලැබූ බෞද්ධ මහා සම්මේලනයේ හිටපු කීර්තිමත්ම ගරු සභාපතිවරයෙකු සහ ලෝක බෞද්ධ මහා සම්මේලනයේ නිර්මාතෘ මහාචාර්ය ගුණපාල මළලසේකර මැතිතුමාගේ 49 වන ගුණානුස්මරණ වැඩසටහන අප්‍රේල් 23 දින බෞද්ධ මහා සම්මේලනයේ දී පැවැත්විය. මෙහිදී මහාචාර්ය ගුණපාල මළලසේකර පිළිරුවට පුෂ්පෝපහාර දැක්වීමෙන් අනතුරුව ගුණ සමරු වැඩසටහන ආරම්භ වූ අතර පූජ්‍ය වෑතර මහින්ද ස්වාමීන් වහන්සේද සම්මේලනයේ ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මහතා ද මහාචාර්ය ආරියපාල පෙරේරා මහතා විසින්ද ගුණසමරු දේශන පවත්වන ලදී
















අතිපූජ්‍ය මහානාහක ස්වාමීන් වහන්සේලා බැහැදැක බෞද්ධ මහා සම්මේලනය සහ ජාතික සංවිධාන ඒකාබද්ධ ක්‍රියාන්විතය සමඟ සකසන ලද වර්තමාන ආර්ථික අර්බුදය සඳහා වූ විසඳුම් මාලාව පිළිගැන්වීම





"සමාජ ආර්ථික අර්බුදය හමුවේ එට සුරකින ගමන් මඟ"
බෞද්ධ මහා සම්මේලනය සහ බෞද්ධ සංවිධාන විසින් කෙටුම්පත් කරන ලද වර්තමාන ආර්ථික අර්බුදයට විසඳුම් මාලාව ජනගත කිරීමේ මාධ්‍ය සාච්ඡාව 2022-04-26 දින පැවැත්වුණි



එකමුතුවෙන් ජාතික අර්බුදය හමුවේ අපගේ ගමන් මඟ පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීමේ මාධ්‍ය වැඩසටහන 2022-04-08 දින සමුළු මූලස්ථානයේ පැවැත්වීය





# බෞද්ධාලෝක වෙසක්

## ශ්‍රී බු.ව. 2566/2022

## කොළඹ 07 බෞද්ධාලෝක මාවතේ දී

## මැයි 15, 16 සහ 17 දිනවලදී

"ආරෝග්‍යා පරමා ලාභා" යන තේමාව මුල්කොට ගනිමින් තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ උතුම් වූ තෙමඟුල සිහිපත් කොට ලෝවැසි සියළු බෞද්ධයන් වෙසක් පොහෝ දිනය සමරන මේ අවස්ථාවේදී සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය 21 වැනි වතාවටත් අභිමානවත් අයුරින් බෞද්ධාලෝක වෙසක් උළෙල මෙවර සංවිධානය කරයි.

**මෙම උතුම් පිංකමේදී පසුගිය වසරවලදී මෙන්ම විශේෂ ක්‍රියාකාරකම් කිහිපයක් සිදුකරනු ලැබේ.**

- සර්වඥ ධාතූන් වහන්සේලා වන්දනාව
- සීල සමාදාන වැඩ සටහන
- රාත්‍රි බත් දන්සල්
- හෙළ ඔසු දන්සල
- ආලෝක පූජාව



සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය
අංක 380, බෞද්ධාලෝක මාවත, කොළඹ 7. දුර : 011 2691695 ෆැක්ස් : 011 2688 517 වෙබ් අඩවිය - www.acbc.lk